# ලාංකේය ගුවන්විදුලිය මාධ්‍යයේ ශ්‍රවණ පර්යේෂණ ක්‍රියාවලිය සහ එහි සමාජ සන්නිවේදනාත්මක වැදගත්කම

**සේන නානායක්කාර**

**<u>මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ</u>**

**සාරාංශය**

බ්‍රිතාන්‍ය ගුවන්විදුලිය තුළ ශ්‍රවණ පර්යේෂණ කාර්යය ආරම්භ වනුයේ 1930 දශකයේ මුල් භාගයේ පමණ ය. ලාංකේය ගුවන්විදුලි ක්ෂේත්‍රයට එකී ක්‍රියාවලිය ප්‍රවේශ වනුයේ 1940 දශකයේ අගභාගයේ දී ය. වඩාත් විධිමත් හෝ විෂයානුකූල ක්‍රමවේදයන් අනුව නො වූව ත්, එවකට අදාළ සමීක්ෂණ දත්ත කරණකොටගෙන තත්කාලීන ගුවන්විදුලිය හා ශ්‍රාවකයා අතර පැවැති සම්බන්ධතාව මැනැවින් හෙළිදරව් වෙයි. එකී ශ්‍රවණ පර්යේෂණයන් උදෙසා අරමුණු කෙරුණු සරල කරුණු පසුකාලීන ව වඩාත් සංකීර්ණ සමාජවිද්‍යාත්මක ප්‍රස්තුතයන් දක්වා විකාශනය විය. එනම්, ශ්‍රාවක රුචිකත්වය විමසීමේ ක්‍රියාවලිය නව සමාජ පරිවර්තනයන් කෙරෙහි තුඩුදෙන අවධානයන් දක්වා දෘෂ්ටිමය වශයෙන් පුළුල් විය.

1978 බ්‍රිතාන්‍ය ජාතික ගුවන්විදුලි විශේෂඥයකු වූ පීටර් ඩැන්හයිසර්ගේ නිර්දේශයට අනුව පිහිටුවා ගත් ශ්‍රී ලංකා ගුවන්විදුලි ශ්‍රවණ පර්යේෂණ අංශය විසින් පසුකාලීන ව සිදුකළ පර්යේෂණ කාර්යයන් ප්‍රමාණයෙන් ඉතා විශාල ය. ඒ ඒ කාල වකවානු තුළ ගුවන්විදුලි මාධ්‍ය ක්ෂේත්‍රයේ විවිධ වැඩසටහන් සහ ඒ හා බැඳුණු ශ්‍රාවක සම්බන්ධතා ද එමගින් විවිධ ස්වරූපවලින් පිළිබිඹු කෙරෙයි.

ශ්‍රාවක ප්‍රතිචාර නිවැරදිව හඳුනාගැනීම ගුවන්විදුලිය මාධ්‍යයෙහි පැවැත්ම සහ අභිවර්ධනය උදෙසා වඩාත් වැදගත් වෙයි. ඒ අනුව ශ්‍රවණ පර්යේෂණයකින් ගොඩනැගෙන ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය ගුවන්විදුලිය මාධ්‍යයේ ජීවය ලෙස සැලකේ. මෙම අධ්‍යයනයෙන් කුළුගන්වන්නට ප්‍රෝත්සාහී වනුයේ එබඳු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක් උදෙසා පාදක කොටගත හැකි ශ්‍රවණ පර්යේෂණ ක්‍රියාවලීන්ට අදාළ විද්‍යාත්මක පසුබිම වෙයි. ගුවන්විදුලිය වඩාත් විචිත්‍රාංගශීලී සරල විනෝදාස්වාදන මාධ්‍යයක් වුව ද, ඊට අදාළ සමාජ සන්නිවේදනාත්මක පසුතලය කෙතරම් වැදගත් කොට සැලකිය යුතු ද? යන්න මින් අවධාරණය කෙරේ. ඒ අනුව ගුවන්විදුලිය ශ්‍රවණ පර්යේෂණ ක්‍රියාවලියක සමාජීය වැදගත්කම හා කාලීන අවශ්‍යතාව ද, එය තත් සමාජ ප්‍රගමනය උදෙසා දක්වන මහඟු පිටිවහල ද මෙමගින් තර්කානුකූලව ස්ඵුට කෙරේ.

**කේන්ද්‍රීය වචන:** ශ්‍රවණ පර්යේෂණ, ග්‍රාහක කොට්ඨාසය, ප්‍රතිපෝෂණය, සහභාගීත්ව නිරීක්ෂණය

## හැඳින්වීම

ජනමාධ්‍ය සම්බන්ධයෙන් සිදුකරන ග්‍රාහක සමීක්ෂණ විවිධාකාර ය. ඒ අනුව, ගුවන්විදුලිය මාධ්‍යයට අදාළ ව පැවැත්වෙන විමර්ශනයන් ශ්‍රවණ පර්යේෂණ ලෙස හැඳින්වෙයි. මේ සඳහා කේන්ද්‍රකොට ගැනෙනුයේ ගුවන්විදුලිය මාධ්‍යය මගින් විසුරුවා හැරෙන වැඩසටහන් වුව ද, එකී වැඩසටහන්වලට අදාළ විවිධ සමාජීය කරුණු, විවිධ දෘෂ්ටීන් හරහා මෙමගින් ගවේෂණය කෙරේ. එනම්,

යම්කිසි වැඩසටහනකට ශ්‍රාවකයා දක්වන රුචිය, එහි ඉෂ්ටානිෂ්ට ඵල හෝ ප්‍රබලතා, දුබලතා ආදිය පමණක් නොව සමාජ බලපෑම්කාරකයක් වශයෙන් එමගින් මතුකෙරෙන නව ප්‍රවණතා ද එහිදී නිරීක්ෂණය කෙරේ.

එය පශ්චාත් ප්‍රතිපෝෂණාත්මක සාධනීයතා ප්‍රකට කෙරෙන එක්තරා අධ්‍යාපනික ක්‍රියාවලිය කි. මන්දයත්, ඕනෑම ජනමාධ්‍යයක් විසින් රැස්කරගනු ලබන ප්‍රතිචාර විමසුමට ලක්කිරීම මගින් එය තවදුරටත් පවත්වා ගැනීමේ හා ස්ථාවර ලෙස දියුණුකර ගැනීමේ ශක්‍යතා පළ කරන බැවිනි.

## සාහිත්‍ය විමර්ශනය

මෙම පර්යේෂණ නිබන්ධයෙහි ලා පරිශීලිත නව කෘතීන් මගින් ශ්‍රවණ පර්යේෂණයෙහි ඓතිහාසික තොරතුරු හඳුනාගත හැකි ය. ශ්‍රවණ පර්යේෂණ විෂයයෙහි ලා සෘජුව ම එල්ලකෙරුණු මාධ්‍යවිද්‍යානුකූල ග්‍රන්ථයන් හා අදාළ සමීක්ෂණ වාර්තාවන් ද ඒ අතර වෙයි. Brown,W and Shanon,G (1996) විසින් සම්පාදිත Audience Research in to Radio: Key Areas of Sociological Methods කෘතිය ඒ සඳහා වන ශාස්ත්‍රීය සංනිදර්ශනය කි. මීට අදාළ ව සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් ලියැවුණු කෘතීන් තිබුණ ද ඒ සියල්ල තුළ අවධානය යොමු කෙරෙනුයේ හුදු ප්‍රමාණාත්මක ඇගයුම් පිළිබඳ ව බව පෙනේ.

නමුත්, මෙම පර්යේෂණ නිබන්ධයෙහි ලා අවධානය යොමු කරෙනුයේ එකී කෘතීන් කෙරෙහි විෂය කොටගැනුණු ශ්‍රවණ පර්යේෂණයේ හුදු සමාජ සම්බන්ධතාව පමණක් නොව, ඊටත් ගැඹුරින් නිදන්ගත ව සක්‍රීය වන සමාජ ආර්ථික දේශපාලනික හා සාංස්කෘතික විචල්‍යතාව යි. හුදෙක් ශ්‍රාවකයින් පිළිබඳ ව හෝ වැඩසටහන් පිළිබඳ ව ප්‍රමාණාත්මක ගණනයකට වඩා සමාජීයවිද්‍යානුකූල ගුණාත්මක ඇගයුමක් ඒ මගින් අපේක්ෂා කළ හැකි අතර, මාධ්‍ය හා සමාජය අතර සක්‍රීය වන සත්‍ය විචල්‍යතාවන් එමගින් විද්‍යාත්මක ව විශද වෙයි. ගතානුගතික ශ්‍රවණ පර්යේෂණ ක්‍රියාවලියකට වඩා එවැන්නක සමාජ හිතකාමී ඵලදායීතාව උක්ත මාධ්‍ය අභිවර්ධනයෙහි ලා මෙන් ම සමාජ සංවර්ධනයෙහි ලා ද මහෝපකාරී වනු ඇත. මෙකී අධ්‍යයනයෙහි භාවිත සාහිත්‍ය විමර්ශනය වඩාත් වෙසෙස් වන්නේ එබැවිනි.

## පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සලකා බලන කල සමාජ විකාශනයත් සමග ම ගුවන්විදුලි ශ්‍රවණ පර්යේෂණ ක්‍රියාවලිය ඓතිහාසික ව වර්ධනය වූ ආකාරය හා එහි සමාජ සන්නිවේදනාත්මක අවශ්‍යතාව කෙබඳු ද? යන්න මෙම අධ්‍යයනයෙහි ලා කේන්ද්‍රීය ගැටලුව යි.

## පර්යේෂණ අරමුණු

21 වන සියවසට එහා දිවෙන නව ජනමාධ්‍ය සංස්කෘතික ගමන්මගෙහි පියවර සළකුණු මේ තුළ සටහන් වෙයි. සංවර්ධනය හඹා යමින් සිටින, එමෙන් ම දැනුමින් පිරිපුන් ජන සමාජයක මූඛ්‍ය අවශ්‍යතා රැසක් මෙමගින් සපිරෙනු

ඇතැයි විශ්වාස කෙරේ. යහපත් රුචිය හා වින්දනය ඉහළ තලයක් කරා ප්‍රවේශ කරවීමත්, එය අරුත්බර දැනුවත්භාවයක් උදෙසා පරිවර්තනය කිරීමට අවශ්‍ය පසුබිම සැකසීමත් එහි පුළුල් අපේක්ෂාව යි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ගුවන්විදුලිය මාධ්‍යය සම්බන්ධයෙන් සලකා බලන කල ශ්‍රවණ පර්යේෂණ ක්‍රියාවලියක සමාජ සන්නිවේදනාත්මක වැදගත්කම විදුහුරු විමසුමකට ලක්කරවීම මෙහි අරමුණ වේ.

## පර්යේෂණයේ වැදගත්කම

ශ්‍රවණ පර්යේෂණය වූ කලී ගුවන්විදුලිය මාධ්‍යයේ විමර්ශන කාර්යය කි. ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය පිළිබඳ නිවැරදි පදනමක් ගොඩනගාගැනීම ඒ මගින් සිදුකෙරේ. ඕනෑම මාධ්‍යයක් සම්බන්ධයෙන් ගත් කල එය වඩාත් ඵලදායක ක්‍රියාකාරකම කි. ඒ අනුව මෙකී පර්යේෂණ අධ්‍යයනයේ වැදගත්කම කොටස් දෙක කි.

1. ලාංකේය ගුවන්විදුලිය මාධ්‍යයේ ශ්‍රවණ පර්යේෂණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන අප්‍රකට තොරතුරු හා පසුකාලීන ක්‍රමවිකාශනය පිළිබඳ යථාවබෝධය ශ්‍රාවකයා වෙත ප්‍රවේශ කරවීම සහ
2. එමගින් ගොඩනැගිය හැකි නව ශ්‍රවණ පර්යේෂණ ක්‍රමවේදයන් සැකසීමේ අවකාශය මතුකිරීම

මේ අනුව ගත්කල මෙකී පර්යේෂණ අධ්‍යයනය ශ්‍රී ලාංකේය ගුවන්විදුලිය මාධ්‍ය ක්ෂේත්‍රයේ නව විචාරාත්මක ප්‍රවේශයක් ගොඩනැගීම උදෙසා බෙහෙවින් වැදගත් වෙයි.

## පර්යේෂණ ක්‍රමවේදය

1948 සිට දශක පහක කාලයක් තුළ ලංකා ගුවන්විදුලි සේවාවට අදාළ ව සිදු කෙරුණු ශ්‍රවණ පර්යේෂණ පිළිබඳ මුද්‍රිත තොරතුරු හා ඊට අදාළ සෙසු ලිඛිත සාධක පරිශීලනය.

## සාකච්ඡාව

වැට්සන් හා හිල්ට (1991:15) දක්වන ආකාරයට යම් කිසි ජනමාධ්‍යයක ක්‍රියාකාරිත්වය හා එහි සමාජ බලපෑම් විග්‍රහ කිරීමේදී එකී මාධ්‍ය හා ග්‍රාහකයා අතර පවත්නා සම්බන්ධතා නොසලකා හැරිය නොහැකි ය. ග්‍රාහකයාගෙන් තොර ජනමාධ්‍යයක් ගැන සිතිය නොහැකි බැවිනි ඒ. මුද්‍රිත මාධ්‍යයේදී පාඨකයෝත්, විද්‍යුත් මාධ්‍යයේදී ශ්‍රාවකයෝ මෙන් ම ප්‍රේක්ෂකයෝ ද මේ ග්‍රාහක කොට්ඨාසයට අයත් වෙති. මේ සියල්ල එක්තන්හි ලා කෙරෙන විමර්ශනයක් නම් කෙරෙන්නේ ජනමාධ්‍ය ග්‍රාහක පර්යේෂණ හෙවත් Audience Research නමිනි. එබැවින් ගුවන්විදුලිය මාධ්‍යය හා එහි ශ්‍රාවකයා අරමුණු කොටගෙන කෙරෙන විමර්ශනයන් ද යථෝක්ත ජනමාධ්‍ය පර්යේෂණ ගොන්නට ගිනිය හැක. ඒවා ශ්‍රවණ පර්යේෂණ (මහේන්ද්‍ර 1997:23-24) ලෙස අපි හඳුන්වමු.

ශ්‍රවණ පර්යේෂණ යනු කුමක් දැයි පුළුල් වශයෙන් සලකා බලන කල කුළුගැන්වෙන ප්‍රධාන කරුණු කිහිපය කි. වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම මේ සඳහා ඉලක්ක කොට ගැනෙනුයේ ගුවන්විදුලිය මාධ්‍යය යි. එය හුදෙක් ගුවන්විදුලියේ දැක්වෙන තාක්ෂණික හා කාර්මික පක්ෂයට පමණක් සීමාවූවක් නොවේ. ඊට හේතුව, ජනමාධ්‍යයක් ප්‍රබලත්වයට පත්වෙනුයේ තාක්ෂණ හාස්කම් නිසා පමණක් නොවීම යි. එය ඉක්මවූ ග්‍රාහක මණ්ඩලයක් එම මාධ්‍ය කෙරෙහි නැඹුරුවක් දක්වන්නේ ද යන්න සාක්ෂි සහිත ව හඳුනාගැනීමෙනි. එබැවින් ගුවන්විදුලිය මාධ්‍ය කෙරෙහි නැඹුරුව සිටින ශ්‍රාවක සමූහයා හඳුනාගැනීමත්, මේ දෙපාර්ශවයෙහි අන්තර් සම්බන්ධතාව විවිධ දෘෂ්ටීන්ගෙන් විමසා බැලීම ත් ශ්‍රවණ පර්යේෂණයක් ලෙස සඳහන් කළ හැකි ය.

වැට්සන් හා හිල්ට (1991:25) අනුව බ්‍රිතාන්‍ය ගුවන්විදුලිය සිය ශ්‍රවණ පර්යේෂණ කටයුතු ආරම්භ කොට ඇත්තේ 1931 දෙසැම්බර් මාසයේ සිට බව මූලාශ්‍රය පෙන්වා දෙයි . එකල බ්‍රිතාන්‍ය ඇතුළු බටහිර රටවල සමාජ විද්‍යාත්මක පර්යේෂණ රීතීන් ඔස්සේ මෙම කාර්යය වඩාත් පුළුල් ව සිදු කෙරුනත්, ලංකා ගුවන්විදුලිය තුළ එම තත්ත්වය දක්නට නොලැබිණි. නමුත්, පසුකාලීන ශ්‍රවණ පර්යේෂණ විෂයයෙහි ලා අපේ ඉතිහාසය වඩාත් වැදගත් හා රසවත් සිද්ධීන්ගෙන් අනූන යැයි විමර්ශනයේදී පෙනී යයි. ඒ සම්බන්ධ වැදගත් කරුණු කිහිපයක් ලුහුඬින් හෝ ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය යැයි හැඟේ.

කොළඹගේ (1980 : 50-51) දක්වන ආකාරයට 1948 වන විට විධිමත් පර්යේෂණ අංශයක් නොතිබුනත් අසන්නන්ගේ අදහස් උදහස් දැනගැනීම සඳහා එවක ලංකා ගුවන්විදුලි සේවාව වඩාත් උනන්දු වී ඇතැයි සිතිය හැකි ය. ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කෙරුණු විවිධ ප්‍රශ්න අසන්නන් වෙත ඉදිරිපත්කොට පිළිතුරු ලබාගැනීම මගින් හැකි පමණ පර්යේෂණාත්මක නිගමනවලට එළඹීම එකල සිදුවී ඇත. මෙහි පහතින් දැක්වෙන්නේ 1948 දී අසන්නන් වෙත යැවුණු එබඳු ඉංග්‍රීසි ප්‍රශ්නාවලියක සිංහල අනුවාදය යි.

**ගුවන්විදුලිය පිළිබඳ ප්‍රශ්න මාලාවක්**

**(අසන්නන් විසින් මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයා ළඟම තැපැල් කන්තෝරුවට බාරදිය යුතු ය. නැතහොත් තැපැල් පෙට්ටියක බහාලිය යුතු ය. මුද්දර අවශ්‍ය නොවේ.)**

**සාමාන්‍ය**

1. ඔබ කොළඹ ගුවන්විදුලියට කන් දෙන්නෙහි ද? එසේ නම් ඔබ කැමති සිංහල/දෙමළ හෝ ඉංග්‍රීසි වැඩසටහන්වලට ද?

2. දැනට වැඩසටහන් ප්‍රචාරය කෙරෙන පහත සඳහන් වේලාවලට ඔබ කැමති ද?

   (අ) පෙරදිග වැඩසටහන් අ.භා. 5.45 සිට 9.00 දක්වා - ඔව්/නැහැ

   (ආ) ඉංග්‍රීසි වැඩසටහන් - රාත්‍රී 9.00 සිට 11.00 දක්වා - ඔව්/නැහැ

   (ඇ) සතියේ දෙදිනක් තුළ මෙම පිළිවෙළ මාරු කරනවාට ඔබ කැමති ද?

| |
|---|
| 3. ප්‍රාදේශීය ප්‍රවෘත්තිවලට කන් දීමට ඔබ කැමති වේලාව කුමක් ද?<br>(අ) සවස<br>(ආ) රාත්‍රිය |
| 4. ගුවන්විදුලි තරග පවත්වා තෑගි දෙනවාට ඔබ එකඟ ද? |
| 5. තැටි ආධාරයෙන් ප්‍රචාරය වන වැඩසටහන්වලට වඩා සජීවී ශිල්පීන්ට ඔබ කැමති ද? |

**ඉංග්‍රීසි**

| |
|---|
| 1. ඔබ කැමති කුමන අන්දමේ සංගීතයකට ද?<br>ශාස්ත්‍රීය, ජෑස්, නැටුම් හෝ සරල සංගීතය |
| 2. ගුවන්විදුලිය මගින් ඔබ අසන්නට කැමති අධ්‍යාපන විෂයයන් මොනවා ද? |
| 3. පහත සඳහන් වැඩසටහන්වලින් ඔබ කන් දෙන්නේ මොනවාට ද?<br>ළමා පිටිය, ඉරිදා විවිධ ප්‍රසංගය, යෞවන සමාජය, අසන්නන් කැමති ගී, (ශිල්පියා නම් කරන්න), සාහිත්‍ය ප්‍රහේලිකාව, කෙටි කතාව, ඉංග්‍රීසි කවීන්ගේ කවි කියවීම, කතා, රේඩියෝ පොත්ගුල, නැටුම් සංගීත කාලය, නිදර්ශන සහිත කතා (ඔබ කන් නොදෙන වැඩසටහන් කපා හරින්න) |
| 4. වෙනත් විචිත්‍රාංග ඔබට යෝජනා කළ හැකි ද? |

**සිංහල**

| |
|---|
| 1. ඔබ කැමති කුමන අන්දමේ සංගීතයකට ද?<br>ශාස්ත්‍රීය, සරල, වාද්‍ය සංගීතය |
| 2. ඔබ අපේ විචිත්‍රාංගවලට කන් දෙන්නෙහි ද? ළමා පිටිය, අසන්නන් කැමති ගී, කථාන්තර, ස්වදේශ ප්‍රවෘත්ති, ඉන්දියානු ප්‍රවෘත්ති, ගී ගායනා, ලෝක ප්‍රවෘත්ති විවේචනය, කවි මුළුව, වටින් පිටින්, තැපැල් මල්ල සහ බුද්ධි මණ්ඩලය - ඒ පිළිබඳ ඔබේ අදහස් මොනවා ද? |
| 3. සිංහල විවිධ ප්‍රසංගවලට ඔබ නිතර කන් දෙන්නෙහි ද? ඒ පිළිබඳ ඔබේ අදහස් මොනවා ද? |
| 4. ඔබ අසන්නට කැමති (පෙරදිග) ගුවන්විදුලි ශිල්පීන් හය දෙනෙකු නම් කරන්න. |
| 5. වැඩසටහනට ඇතුළත් කිරීමට ඔබ කැමති වෙනත් අංග තිබේ ද? |

### දෙමළ

| |
|---|
| 1. දෙමළ ගුවන්විදුලි විවිධ ප්‍රසංග පිළිබඳ ඔබේ අදහස් මොනවා ද? කථා පිළිබඳ ඔබේ අදහස් මොනවා ද? |
| 2. ඔබ අසන්නට කැමති වෙනත් මාතෘකා මොනවා ද? |
| 3. පහත සඳහන් වැඩසටහන් පිළිබඳ ඔබේ අදහස් මොනවා ද? බුද්ධි මණ්ඩලය, ළමා පිටිය, විවේක වක්‍රම්, කර්ණාටක රාග |
| 4. තැටි ආධාරයෙන් ඔබ අසන්නට කැමති ශාස්ත්‍රීය සංගීතය ද? චිත්‍රපට සංගීතය ද? |
| 5. කොරාන් ගායනා සහ ආගමික කථා පිළිබඳ ඔබේ අදහස් මොනවා ද? |

> “ලංකා ගුවන්විදුලි සේවාව තුළ නිල වශයෙන් ශ්‍රවණ පර්යේෂණ ඒකකයක් පිහිටුවාලූයේ 1956 ජූලි මස 02 වැනිදා ය” **(Karunanayake 1990 : 38).**

> “බ්‍රිතාන්‍ය ගුවන්විදුලියේ පුහුණුවක් ලද පී.ඩබ්.එස්. පෙරේරා මහතා එහි ප්‍රථම ශ්‍රවණ පර්යේෂණ කටයුතු භාර නිලධාරියා ලෙස පත්විය. රාජනීතිඥ එන්. ඊ. වීරසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් 1953 දී පත්කරන ලද කොමිසමේ වාර්තාවට (1955) අනුව පිහිටුවාගත් මෙම ඒකකයේ ප්‍රධාන කාර්යභාරයන් දෙකක් විය” (කොළඹගේ 1980 : 119).

I. ගුවන්විදුලි වැඩසටහන්වලට සහභාගි වන අයගේ සංඛාව සොයා බැලීම සහ

II. ඒ සඳහා අසන්නන්ගේ ප්‍රතිචාර දූනගැනීමත් ය.

ඒ හැර, ගුවන්විදුලි බලපත්‍ර ප්‍රමාණය ගණනය කිරීම, රටපුරා ඇති ගුවන්විදුලි යන්ත්‍ර ප්‍රමාණය සොයා බැලීම, වැඩසටහන්වල ජනප්‍රියතාව ඇගයුමට ලක්කිරීම හා එකී වැඩසටහන්වල ප්‍රයෝජනය සොයා බැලීම ආදිය මෙහි සෙසු කාර්යභාරයන් වී ඇත. එම අරමුණු පෙරදැරි කොට ගෙන 1957 සැප්තැම්බර් මස 30 වෙනිදා සිට ඔක්තෝබර් 06 වෙනිදා අවසන් වන සතිය තුළ ගුවන්ගත කරන ලද වැඩසටහන් පිළිබඳ පැවැත්වූ විධිමත් පර්යේෂණය අප ගුවන්විදුලි ශ්‍රවණ පර්යේෂණ ඉතිහාසයේ වැදගත්කම් ප්‍රකට කරන මුල්කාලීන සිදුවීමකි.

කොළඹගේ (1989: 66, 69) දක්වන්නේ 1978 වර්ෂයේ දී ශ්‍රී ලංකා ගුවන්විදුලියේ පර්යේෂණ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා මෙහි පැමිණි බ්‍රිතාන්‍ය ගුවන්විදුලි විශේෂඥ පීටර් ඩැන්හයිසර් (Pieter Danheizer ) මහතා අතින් එහි විධිමත් බව තවදුරටත් තහවුරු වූ බැව් මූලාශ්‍රය පෙන්වා දෙයි. අදාළ නිර්දේශ ඉදිරිපත් කළ ඩැන්හයිසර් වාර්තාව නිගමනය කළේ ශ්‍රවණ පර්යේෂණ අංශය ජනමාධ්‍ය විෂයයෙහි පශ්චාද් උපාධි සුදුසුකම් ලද්දකු යටතේ අධ්‍යක්ෂ මට්ටමට ගෙන ආ යුතු බව ත්, පර්යේෂණ නිලධාරීන් කිහිප දෙනෙකු පත්කළ යුතු බවත් ය. ඒ අනුව 1982 අප්‍රේල් මස 01 වැනි දා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රථම ශ්‍රවණ පර්යේෂණ අධ්‍යක්ෂ ලෙස නන්දන කරුණානායක මහතා පත් වූ අතර, අප්‍රේල් 15 වැනි දා තවත් නිලධාරීන් 06 දෙනෙක් පර්යේෂණ අංශය සඳහා පත් කරගන්නා ලද හ.

සැබැවින් ම, ශ්‍රී ලංකා ගුවන්විදුලියේ ශ්‍රවණ පර්යේෂණ කටයුතු විෂයයෙහි ලා වඩාත් වැදගත් වූත්, විද්‍යාත්මක වූත් සැලසුම් හා සමීක්ෂණයන් දියත් කෙරුණේ ඉන් අනතුරුව බැව් නිගමනය කිරීම අතිශයෝක්තියක් නොවේ. 1982 සිට 1988 දක්වා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ශ්‍රවණ පර්යේෂණ අංශය විසින් සිදු කරන ලද පර්යේෂණවල සාරාංශ ඇතුළත් කොට සකස් කළ "Compendium of Audience Research Abstracts 1982 -1988" (ශ්‍රවණ පර්යේෂණ සාරාංශ සංහිතාව 1982-1988) නම් ඉංග්‍රීසි ප්‍රකාශනය ඊට හොඳ ම සාක්ෂිය යි. විවිධාකාරයේ ශ්‍රවණ පර්යේෂණ රාශියක් පිළිබඳ සාරාංශ මීට ඇතුළත් ව ඇත. එනම්, විවිධ විෂයයික වැඩසටහන් පිළිබඳ ව, රට තුළ ව්‍යාප්ත ව ඇති ගුවන්විදුලි යන්ත්‍ර සංඛ්‍යාව හා ශ්‍රාවක පිරිස් පිළිබඳ ව, රුචිකත්වයන් හා රසවින්දන මට්ටම් පිළිබඳ ව මෙන් ම, ප්‍රාදේශීය සේවාවන්, ජනප්‍රියතාවන් හා ශ්‍රාවක ප්‍රතිචාරයන් ද මේ පර්යේෂණයන්ට විෂය වී ඇත.

පහත දැක්වෙන්නේ 1980 දශකය තුළ දී ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ශ්‍රවණ පර්යේෂණ අංශය තුළ සිදු කෙරුණු වැදගත් සිදුවීම් කිහිපය කි (ලිඛිත මූලාශ්‍රය රාශියක් ඇසුරෙනි).

1982 ජනවාරි - ජනවාරි මාසය "ගුවන්විදුලි මාසය" ලෙස නම් කොට කැලණිය විශ්වවිද්‍යාලයීය ජනසන්නිවේදන අධ්‍යයන අංශය මඟින් දීප ව්‍යාප්ත ශ්‍රවණ සමීක්ෂණය පැවැත්වීම.

1983 ජූනි 14 - 82 ගුවන්විදුලි මාසයේ තරගකරුවනට ත්‍යාග බෙදාදීම හා "ගුවන්විදුලි මාසය සහ ශ්‍රාවක ප්‍රතිචාර" නම් වාර්තාවක් නිකුත් කිරීම.

1983 ඔක්.20, දෙසැ. 30 - ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ රජරට සේවය පිළිබඳ ශ්‍රවණ සමීක්ෂණය.

1983 ඔක්. 24 - ශ්‍රවණ පර්යේෂණ නිලධාරීන්ගේ කාර්යභාරයන් අරමුණු කොට ගත් අධ්‍යයන පාඨමාලාවක් ආරම්භ කිරීම.

1983 දෙසැ. 30 - "Directory of Resource Persons Part I and Part II" නම් (ගුවන්විදුලි වැඩසටහන්වලට සම්බන්ධ කරගැනීමට සුදුසු යැයි හැඟෙන සම්පත් දායකයින්ගේ නාම ලේඛනය) ප්‍රකාශනය නිකුත් කිරීම.

1984 පෙබ. 29 - මහවැලි ප්‍රජා ගුවන්විදුලිය පිළිබඳ සී.ඩී හා එච් කලාපවල ශ්‍රවණ සමීක්ෂණයක් පැවැත්වීම.

1986 ජනවාරි - දීපව්‍යාප්ත වෙළෙඳ ගුවන්විදුලි සමීක්ෂණය.

1987 පෙබරවාරි- ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය භාවිතය පිළිබඳ දීපව්‍යාප්ත සමීක්ෂණය.

1987 මාර්තු - ගුවන්විදුලි අධ්‍යාපන වැඩසටහන් පිළිබඳ දීපව්‍යාප්ත ශ්‍රවණ සමීක්ෂණය.

1987 ජූනි 03 - අසන්නතන්ගේ ඉල්ලීම් පිළිබඳ ශ්‍රවණ සමීක්ෂණය.

1987 ජූනි 18 - 'ඇසුවේද කවුරුන් හෝ' දීපව්‍යාප්ත ශ්‍රවණ සමීක්ෂණය.

1987 අගෝ.15 - ගුවන්විදුලි බෞද්ධ වැඩසටහන් පිළිබඳ දීපව්‍යාප්ත ශ්‍රවණ සමීක්ෂණය.

1987 ඔක්.15 - සිංහල කැසට් සංගීතය, එහි ව්‍යාප්තිය හා ශ්‍රාවක පිරිස පිළිබඳ ශ්‍රවණ සමීක්ෂණය.

1987 ඔක්.24 - ගුවන්විදුලි නාට්‍ය, නාට්‍ය ශිල්පීන් හා රචකයින් පිළිබඳ දීපව්‍යාප්ත ශ්‍රවණ සමීක්ෂණය.

1987 ඔක්. 27 - යෝජිත සූරියවැව ප්‍රජා ගුවන්විදුලිය සඳහා වූ පෙර විමසුම් සමීක්ෂණය.

1987 දෙසැ. - මාතර පල්ලාවල ග්‍රාමය ඇසුරින් "ග්‍රාමීය සන්නිවේදන රටාව තේරුම් ගැනීම" පිළිබඳ සමීක්ෂණය.

1988 මාර්තු - "ගුවන්විදුලි නාට්‍යය, රුචිකත්වය, රස වින්දනය හා ශ්‍රාවක අත්දැකීම්" නමින් මාතර දිස්ත්‍රික් නාගරික ශ්‍රාවකයින් අතර ශ්‍රවණ සමීක්ෂණයක් පැවැත්වීම.

1988 මාර්තු - 1982 අප්‍රේල් 01 දා සිට 1988 දක්වා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ශ්‍රවණ පර්යේෂණ අංශය විසින් සිදු කරන ලද පර්යේෂණවල සාරාංශ ඇතුළත්කොට සකස් කළ "Compendium of Audience Research-Abstracts 1982 - 1988" (ශ්‍රවණ පර්යේෂණ සාරාංශ සංහිතාව) නම් ඉංග්‍රීසි ප්‍රකාශනය නිකුත් කිරීම.

මෙබඳු ශ්‍රවණ පර්යේෂණවලින් අරමුණු වන්නේ කුමක් ද? මෙය ඉතා පුළුල් ලෙස සලකා බැලිය යුතු කාරණය කි. විවිධ අය විවිධ දෘෂ්ටීන්ගෙන් සැදුම්ලත් අරමුණු රාශියක් මෙහිදී ඉදිරිපත් කරති. ඒ සියල්ල වඩාත් විද්‍යානුකූල වූ සන්නිවේදනාත්මක දෘෂ්ටියකින් විග්‍රහ කරන්නේ නම් ඒවා මෙසේ කෙටි කොට සඳහන් කළ හැකි ය.

i. ගුවන්විදුලිය මාධ්‍ය හා සම්බන්ධ ග්‍රාහක කොට්ඨාස හඳුනාගැනීම.

ii. ඒ හඳුනාගැනීම මගින් ගුවන්විදුලි මාධ්‍ය සම්බන්ධයෙන් ඔවුන්ගේ උවමනා එපාකම් පිළිබඳ අවබෝධය ලබාගැනීම.

iii. ඒ මගින් නිසි පරිදි වැඩසටහන් සැලසුම් කිරීමට හා එහි ක්‍රියාකාරිත්වය වඩාත් විධිමත් කිරීමට ආධාර වීම.

vi. එකී වැඩසටහන් සඳහා ආකල්පමය හා චර්යාමය වශයෙන් ඔවුන් දක්වන ප්‍රතිචාර විමසීම.

v. මේ සියලු ක්‍රියාකාරිත්වයන් මගින් ගුවන්විදුලිය ශ්‍රාවකයා අතර ජනප්‍රිය කොට ඒ හා බැඳුණු සම්පස්ථභාවය තවදුරටත් තහවුරු කිරීම.

ඉහත සඳහන් කළ සංක්ෂිප්ත අරමුණු විවිධ දිශා හා අනු දිශා ඔස්සේ විහිද යයි. අදාළ අන්තර් ක්‍රියාකාරකම් ව්‍යාප්ත ව ඇත්තේ වඩාත් පුළුල් වපසරියක් තුළ යි. ගුවන්විදුලි ශ්‍රවණ පර්යේෂණ කාර්යයක දී සලකා බැලිය යුතු කරුණු කිහිපයක් පිළිබඳ ව විමසීම මේ සඳහා හොඳ ම සාක්ෂ්‍යය යි. නිදසුන් ලෙස මෙහි පළමුවන අරමුණට අදාළ වන ග්‍රාහක කොට්ඨාසය හඳුනාගැනීම පිළිබඳ අපගේ විමර්ශනය යොමු කරමු. මෙහිදී ග්‍රාහක කොට්ඨාසය හඳුනාගැනීම ලෙස අදහස් කළේ ග්‍රාහකයාගේ පුද්ගලික තොරතුරු දැනගැනීම හෝ පුද්ගලික සම්බන්ධතා ගොඩනගා ගැනීම පමණක් නොවේ. ගුවන්විදුලිය මධ්‍ය ක්‍රියාකාරිත්වයේ දී ශ්‍රාවකයා සම්බන්ධයෙන් සමාජ සන්නිවේදන විද්‍යානුකූල ව බලපෑ හැකි සියලු දත්ත හා තොරතුරු වඩාත් විද්‍යානුකූල විමර්ශනයකට ලක්කිරීම යි. ඒවා සුවිශේෂ සමාජ තත්ත්වයන් වශයෙන් නම් කළ හැකි ය. ඒ මන්දයත්, මෙබඳු ශ්‍රවණ පර්යේෂණ කාර්යයක දී අප අවධානය යොමුකරන ප්‍රශ්නවලට අදාළ විසඳුම් මගින් එකී සමාජ තත්වයන් පැහැදිලිව ම පිළිබිඹු කරන බැවිනි. එසේනම් අප මෙහිදී සලකා බැලිය යුත්තේ මෙබඳු ශ්‍රවණ පර්යේෂණයකදී විෂයමූල කොටගන්නා ප්‍රධාන ප්‍රශ්න මොනවා ද? යන්න යි. වඩාත් සංක්ෂිප්ත ව ගතහොත් ඒවා මෙසේ පෙළගැස්විය හැකි ය.

i. ග්‍රාහකයාගේ ජනමාධ්‍ය භාවිතය හා ඔවුන්ගේ පෞද්ගලික රුචි අරුචිකම් හා රසවින්දන මට්ටම් කෙබඳු ද?

ii. ග්‍රාහක කොට්ඨාසයන්හි ජාතික, ආගමික, දේශපාලනික තත්වයන්ට මෙන් ම වයස්, ස්ත්‍රී පුරුෂභාවයන්, අධ්‍යාපන, ආදායම්, ආර්ථික මට්ටම් හා පවුල් ස්වභාවයන් යන විචල්‍යයන් අනුව එකී මාධ්‍ය භාවිතය හා රුචි අරුචිකම් වෙනස් වන්නේ කෙසේ ද?

iii. ගුවන්විදුලිය මඟින් සිය ජීවන රටාවට කරනු ලබන බලපෑම කෙබඳු ද? එය ඉෂ්ට ද අනිෂ්ට ද යන වග?

iv. එසේ කරනු ලබන බලපෑම ශ්‍රාවකයාගේ දෛනික ජීවන චර්යාව වෙනස් කරන්නට සමත් වී ඇත් ද? ඒ කොයි ආකාරයකින් ද?

v. ස්වකීය අපේක්ෂාවන් අලුත් කරවන්නටත් , ශ්‍රාවකයා නව්‍යමය අරමුණුවල පිහිටුවන්නටත් එකී සන්නිවේදනය මගින් ලැබූ පිටිවහල කොතෙක් ද?

vi. තොරතුරු සම්පාදනය, අධ්‍යාපන ඥාන මට්ටම් වෙනස් කිරීම හා විනෝදාස්වාදය සම්පාදනයේ දී ගුවන්විදුලිය මාධ්‍ය දැක්වූ දායකත්වය කෙබඳු ද?

vii. පෙළඹවීම් කාරකයක් ලෙස ගුවන්විදුලිය මාධ්‍යයෙහි ක්‍රියාත්මක ස්වරූපය කොතෙක් ද?

viii. සමාජ ආරක්ෂණ හා සංවිධාන කාර්යයෙහි ලා ගුවන්විදුලිය ඉටු කොට ඇති කාර්යභාරය කෙබඳු ද?

ix. ගුවන්විදුලි සන්නිවේදනය මගින් සමාජානුයෝජන ක්‍රියාවලිය කොතෙක් දුරට ඉටු වී ඇත් ද?

x. සමස්තයක් ලෙස ගත් කල, ගුවන්විදුලිය මාධ්‍ය පොදු ජන ජීවිතයට දක්වන සමීපස්ථභාවය කෙබඳු ද?

මෙහි සඳහන් කරන ලද එක් සංක්ෂිප්ත ප්‍රශ්නයක් තවත් ලෙසකින් සරල ප්‍රශ්න කිහිපයක් ලෙස ද ඉදිරිපත් කළ හැකි ය. අදාළ ප්‍රතිචාරකයාගෙන් නිවැරදි පිළිතුරු වඩාත් නිරවුල් ව ලබාගත හැක්කේ එලෙසිනි. එය ශ්‍රවණ පර්යේෂණ කාර්යයේ දී අනුගමනය කළ යුතු වැදගත් විධික්‍රමය කි. එකී ක්‍රමෝපායයන් පිළිබඳ ව පසුවට විස්තර කෙරෙයි. දැන් විමර්ශනයට භාජනය කළ යුත්තේ මෙබඳු ශ්‍රවණ පර්යේෂණ කාර්යයන්හි වැදගත්කම් මොනවා ද? එහි සාමාජික අවශ්‍යතාව කෙබඳු ද? යන්න පිළිබඳව යි.

"ඕනෑම ජනමාධ්‍යයක් වඩාත් විධිමත් ව පවත්වා ගෙන යාමේ දී "ප්‍රතිපෝෂණ" ක්‍රියාවලියට හිමිවන්නේ ඉතා වැදගත් ස්ථානය කි"(Gamble and Gamble 1986 : 6). ඇතැම් දියුණු රටවල ජනමාධ්‍ය ආයතනයන්හි පිහිටුවා ඇති පර්යේෂණ ඒකක සඳහා වැය කෙරෙන මුදල් සම්භාරය එකී ආයතනය පවත්වා ගැනීම හා සම්බන්ධ ප්‍රධාන කටයුත්තක් ව ඇති බැව් පෙනේ. නිදසුන් වශයෙන් මේ වන විට "ජපානයේ එන්.එච්.කේ. (Nippon Hosso Kyoki) ආයතනයේ පර්යේෂණ ඒකකයේ පමණක් සේවක සංඛ්‍යාව 6000 ඉක්මවා ඇති අතර පර්යේෂණ කටයුතු සඳහා පමණක් වෙන් කෙරෙන මුදල ආයතනික වියදමෙන් සියයට හයකට ත් (6%) වඩා වැඩි ප්‍රතිශතය කි" (MoShov 1990 : 69).

මාධ්‍ය පර්යේෂණ කාර්යයෙහි ලා මේ සා විශාල මුදල් සම්භාරයක් වැය කරනුයේ ඇයි? යන්න සලකා බැලීමේ දී යථෝක්ත ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරු ලැබෙනු නිසැක ය. ග්‍රාහකයා මාධ්‍ය කෙරෙහි දක්වන ප්‍රතිචාර සොයා බලා විමසා, ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක් මගින් එකී මාධ්‍ය තවදුරටත් ශක්තිමත් කරගැනීම මෙයින් සිදු කෙරෙයි. මෙකී ක්‍රියා පටිපාටිය ගුවන්විදුලි මාධ්‍ය ආශ්‍රයෙන් ගත්කල වඩාත් ඵලදායී තත්වයන් පෙන්නුම් කරයි. යථෝක්ත ශ්‍රවණ පර්යේෂණ ක්‍රියාවලියේදී ද සිදු කෙරෙනුයේ ශ්‍රාවක උවමනා එපාකම් සොයා බලා, ඔවුන්ගේ ප්‍රතිචාර විමසා මාධ්‍යයට මෙන් ම පොදු ශ්‍රාවකයාට ද වඩාත් ගෝචරවන්නා වූත්, පවත්නා සමාජ තත්වයන්ට උචිතවන්නා වූත් ගුවන්විදුලි සන්නිවේදන රටාවක් හෝ ආකෘතියක් ගොඩනගා ගැනීම යි. ගුවන්විදුලිය මාධ්‍යය පොදුජනයා අතර චිරාත් කාලයක් නොනැසී පවතින්නට නම් මේ ක්‍රියාවලිය අඛණ්ඩ ව සිදුකළ යුතු ව ඇත.

දාස්ගුප්තා(1992: 79-80) අනුව එපමණක් නොව, නූතන තාක්‍ෂණ ලෝකයේ යම් යම් ජනමාධ්‍ය අයුතු ලෙස ක්‍රියාත්මක කරවීම අද අපට සුලබව දක්නට ලැබෙන්නකි. දැනුවත් ව හෝ නොදැනුවත් ව ඉවක් බවක් නැතිව පවත්වා ගෙනයන මෙබඳු ජනමාධ්‍යය මගින් සමාජයට ඉටු කෙරෙන යහපතක් නැත. විවිධ දේශපාලන, සමාජ හා ආර්ථික දෘෂ්ටීන් කේන්ද්‍ර කොට ගනිමින්, තාවකාලික ලාභාපේක්‍ෂාවන් හා පටු අරමුණු ඔස්සේ ක්‍රියාත්මක වන මෙබඳු සමහර සේවාවන්හි ඵල රහිතභාවය හඳුනාගත හැක්කේ විධිමත් පර්යේෂණයන් මගිනි. එමෙන් ම, එකී කාරණය පිළිබඳ ප්‍රබල ජනමතයක් ගොඩනැගිය හැක්කේත් එම ජනමාධ්‍ය සේවාවන් නිශ්ක්‍රීය කරවිය හැක්කේත් විද්‍යානුකූල පර්යේෂණයන් මගින් ලබාගන්නා තොරතුරු හා දත්තයන් ඇසුරු කොටගෙන යි. මෙකී ධර්මතාව ගුවන්විදුලිය මාධ්‍යයට ද එකසේ පොදු වන්නා වූ දෙයකි. පවත්නා

සමාජ තත්ත්වයනට ගැලපෙන්නා වූත්, සමාජයේ ඉදිරි යහපැවැත්මට අනුකූලවන්නා වූත්, වැඩසටහන් පිළිබඳ පොදුජන දෘෂ්ටියෙන් ඇගයීම් ලැබිය හැක්කේ ද මේ මගින් පමණි.

ගුවන්විදුලිය මාධ්‍ය වූ කලී නන් වැදෑරුම් රුචිකත්වයන් හා රසඥතාවන්ගෙන් යුත් විවිධ සමාජ ආර්ථික හා සංස්කෘතික ස්වරූපයන්හි ජීවත්වන උගත්, නූගත් ආදී වූ විසෘත ජන කොට්ඨාසයක් ආවරණය කෙරෙන පොදු ජනමාධ්‍යය කි. එබැවින්, යට කී කාරණය පිළිබඳ ගැඹුරින් සිතා බැලිය යුතුව ඇත. එක් ශ්‍රාවකයෙක් හෝ කිහිපදෙනෙක් හෝ පමණක් විමසුමට ලක්කොට දීර්ඝකාලීන වූ ත්, සාර්ථක වූ ත් වැඩසටහන් සැලසුම් කිරීම වඩාත් දුෂ්කර මෙන් ම අසාර්ථක කටයුත්තකි. එබැවින්, සමස්ත ශ්‍රාවක සමූහයා නියෝජනය කෙරෙන මෙබඳු ජනමාධ්‍යයක ක්‍රියාකාරිත්වය සිදුකළ යුත්තේ කෙසේ ද? යන අවබෝධය ලබාගැනීමට නම් වඩාත් ක්‍රමානුකූල වූ, විධිමත් ශ්‍රවණ පර්යේෂණ ක්‍රියාවලියක අවශ්‍යතාව කැපී පෙනේ.

මහාචාර්ය ජේම්ස් ඩී. පැලෝ (James D. Pallow) ගේ ප්‍රධානත්වයෙන් සකස් කරන ලද යුනෙස්කෝ පර්යේෂණ වාර්තාවක (UNESCO Report 1981) සඳහන් වන්නේ, සාම්ප්‍රදායික ව පැවත ආ කුචාචාර හා සංස්කෘතික ඥාන මට්ටම් සමුදායක් යටපත් කිරීමට නූතනයේ වැරදි ලෙස ක්‍රියාත්මක වන සමහර ජන මාධ්‍යය සමත්ව සිටින බව යි. මෙකී නිගමනය වඩාත් වලංගු වන්නේ නූතන දෘශ්‍ය මාධ්‍යය කෙරෙහි ලා නමුත්, ගුවන්විදුලිය බඳු ශ්‍රව්‍ය මාධ්‍යයක් කෙරෙහි වුව ද මෙකී සංකල්පය සහමුලින් ම ඉවත දැමිය නො හැකි ය. මෙබඳු නිගමන ලැබිය හැක්කේ විධිමත් මාධ්‍ය පර්යේෂණයක් මගින් පමණි. එසේනම්, එවැනි අනතුරු ඇඟවීම්වලට නිසි ප්‍රතිචාර දක්වන්නට ත් ඊට අදාළ අනාගත සැලසුම් හා ප්‍රතිපත්ති සම්පාදනය කරන්නටත් මෙබඳු පර්යේෂණ පරිපූර්ණ පූර්විකාවක් වෙයි.

> "දැන් අපි සලකා බැලිය යුත්තේ ගුවන්විදුලි ශ්‍රවණ පර්යේෂණ කටයුතු සිදුකළ යුත්තේ කෙසේ ද? යන්න පිළිබඳව යි. මෙය කිහිපාකාරයකට සිදුකළ හැකි ය. විවිධ පර්යේෂණ ක්‍රම රටාවන් හා ආකෘතීන් අනුගමනය කළ ද ඒ සියල්ලට පදනම් වන්නේ සමාජ විද්‍යාත්මක පසුබිම කි. ගුවන්විදුලිය බඳු ජනමාධ්‍යයක් වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම අත්වැල් බැඳගන්නේ සක්‍රීය සමාජයක් සමඟ බැවින් එකී සමාජ විද්‍යාත්මක පසුබිම වඩාත් අත්‍යවශ්‍ය වෙයි. වඩාත් ශාස්ත්‍රීය හා අධ්‍යාපනික තත්ත්වයන් යටතේ මෙකී ක්‍රමෝපායයන් හසුරුවාලීමේ දී සන්නිවේදනාත්මක හා මනෝවිද්‍යානුකූල දාෂ්ටීන් ද ඒ කෙරෙහි පිවිසීම වලක්වාලිය නොහැක" (Finn and Bill 1981: 21).

මෙකී සකලවිධ විෂය දෘෂ්ටීන් ඔස්සේ කෙරෙන ශ්‍රවණ පර්යේෂණ විධි මොනවා ද? ඒවා විවිධාකාර ය.

i. තැපැල් මාර්ගික ප්‍රශ්නමාලා ක්‍රමය (Postal Questionnaire)

ii. ක්ෂේත්‍ර සමීක්ෂණ (Field Research)

iii. ක්ෂේත්‍ර අධ්‍යයන (Field Studies)

vi. දුරකථන ප්‍රශ්නමාලා ක්‍රමය (Telephone Questionnaire)

v. පටිගත කිරීමේ දර්ශන ක්‍රමය (Monitoring System )

තැපැල් මාර්ගික ප්‍රශ්නෝත්තර ක්‍රමයේ දී විශේෂයෙන් සිදු කෙරෙන්නේ ශ්‍රවණ පර්යේෂණයේ අරමුණ හෝ තේමාවට අදාළ ප්‍රශ්න කිහිපයක් විධිමත් ව පෙළගස්වා ශ්‍රාවකයින්ගෙන් ඒවාට පිළිතුරු ලබාගෙන යම් යම් නිගමනවලට එළැඹීම යි. 1987 පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ශ්‍රවණ පර්යේෂණ අංශය විසින් මෙහෙයවන ලද "ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය භාවිතය පිළිබඳ දීපව්‍යාප්ත සමීක්ෂණය" ඊට කදිම නිදසුන කි. මෙබඳු පර්යේෂණයකදී ශ්‍රාවකයාගේ වයස, රැකියාව, ආදායම් තත්ත්වය, අධ්‍යාපන මට්ටම, විවාහක අවිවාහක බව, පවුලේ ස්වභාවය, රුචිකත්වය, රසවින්දන තත්ත්වය, වඩාත් ප්‍රියතම වැඩසටහන, ඒ සඳහා ඔවුන් දක්වන හේතු හා වෙනස් ජනමාධ්‍යය භාවිතයන් පිළිබඳ ව ප්‍රශ්න ද ඒවායේ අඩුපාඩු, දුබලතා හා ඒවා වලක්වා ගැනීමට ගතයුතු යෝජනා හා ක්‍රියාමාර්ග පිළිබඳ අදහස් ද සම්බන්ධ කොටගෙන ප්‍රශ්නාවලිය සකස් වී තිබිය යුතු ය.

ක්ෂේත්‍ර සමීක්ෂණයේදී ත් (Field Research) එම ක්‍රමය ම වඩාත් පහසුවෙන් අනුගමනය කළ හැකි ය. සමීක්ෂකයා අභිමත ප්‍රදේශයක් තෝරාගෙන එහි ප්‍රතිචාරකයින් වෙත ඉදිරිපත් කරනු ලබන විධිමත් ප්‍රශ්නාවලියකට ඔවුන් ඉදිරියේදී ම පිළිතුරු ලබාගැනීම මෙයින් සිදුකෙරේ. මෙය මුල් ක්‍රමයට වඩා වෙනස් වන්නේ අදාළ ප්‍රතිචාරකයා ම ඊට පිළිතුරු දීමත් එය ඒ මොහොතේ ම සමීක්ෂකයා විසින් සටහන් කරගනු ලැබීමත් නිසා ය. එය උපලේඛන හෙවත් අනුලේඛන ක්‍රමය ලෙස ද හැඳින්වේ.

ක්ෂේත්‍ර අධ්‍යයනය (Field Study) ඊටත් වඩා වෙනස් වූ පර්යේෂණ ක්‍රමවේදය කි. පර්යේෂකයා තමන්ට අදාළ ශ්‍රාවක කොට්ඨාසයේ සාමාජිකයින් අතරට පිවිස ඔවුනොවුන් නිරීක්ෂණය කිරීම මඟින් තොරතුරු ලබාගැනීම මෙයින් අදහස් කෙරේ. බොහෝදුරට චරිත හා සිද්ධි අධ්‍යයනයන් (Case Studies) මීට ඇතුළත් ය. නිදසුන් වශයෙන් ගුවන්විදුලියෙන් විසුරුවා හැරෙන කෘෂිකාර්මික වැඩසටහනක් පිළිබඳ ශ්‍රාවකයින්ගේ සජීවී ප්‍රතිචාරයන් හඳුනාගැනීමට අවශ්‍ය අවස්ථාවක කළ යුත්තේ නිරීක්ෂකයින් කිහිපදෙනෙක් ප්‍රදේශ කිහිපයක් නියෝජනය වන පරිද්දෙන් යොදවා අදාළ වැඩසටහන ගුවන්විදුලියෙන් ප්‍රචාරය වන වේලාවේදී ඔවුන් ශ්‍රාවකයින් අතරට යවා ශ්‍රාවකයින්ගේ ප්‍රතිචාර නිරීක්ෂණය කිරීමට කටයුතු සැලැස්වීම යි.

යට කී වැඩසටහන ප්‍රචාරය වන අතරතුර ඒ සම්බන්ධයෙන් ශ්‍රාවකයා දක්වන උනන්දුව හා ප්‍රතික්‍රියා වඩාත් සජීවීව අධ්‍යයනය කිරීමට මේ මීගින් අවස්ථාව සැලසේ. මෙය අතරමැදි විමසුම (Live-Test) ලෙස හඳුන්වනු ලැබේ. පෙර විමසුම (Pre-Test) හා පසු විමසුම ද (Post-Test) මීට ම අදාළ නිරීක්ෂණය කි. යම් වැඩසටහනක් ගුවන් ගත කිරීමට පෙර ශ්‍රාවකයා අතරට පිවිස තොරතුරු අධ්‍යයනය කිරීම "පෙර-විමසුම" ලෙස ත්, වැඩසටහන ප්‍රචාරය වීමෙන් අනතුරු ව තොරතුරු සොයා බැලීම "පසු-විමසුම" ලෙසත් හැඳින්වේ. මේ සියලු අධ්‍යයනයන් සඳහා සමීක්ෂකයා තමාට නියමිත ශ්‍රාවක කොට්ඨාසය හා සහභාගීත්වයක් පෙන්නුම් කරන හෙයින් එය සහභාගීත්ව නිරීක්ෂණය (Participational Observation) ලෙස ද හැඳින්විය හැකි ය. එනම්, ගුවන්විදුලි

ශ්‍රවණ පර්යේෂණයක යෙදී සිටින සහභාගීත්ව නිරීක්ෂකයකු අනිවාර්යයෙන් ම තම ශ්‍රාවක නියැදිය තුළ සිටිය යුතු ය. එවිට ඔහු ලබන්නේ ශ්‍රාවකයාගේ සක්‍රිය ප්‍රතිචාර හෙවත් සජීවී ප්‍රතික්‍රියාවන් ය. මෙය වඩාත් වැදගත් වූත්, සාර්ථක වූත් පර්යේෂණ ක්‍රමෝපායක් ලෙස හැඳින්විය හැකි ය.

මෙහිදී වඩාත් වැදගත් ම ගැටලුව වන්නේ මෙබඳු ශ්‍රවණ පර්යේෂණ මගින් ලබාගන්නා තොරතුරු හා දත්ත ඇසුරු කොටගෙන එළඹෙන නිගමනය සමස්ත ශ්‍රාවක සමූහයාට පොදුවේ ද? යන්න යි. එය වඩාත් නිවැරදි වන්නට නම් රටපුරා වෙසෙන සමස්ත ජනතාව නියෝජනය කෙරෙන නියැදියක් (Sample) ඒ සඳහා යොදා ගත යුතු ය. 'නියැදිය' යනු සමස්තය නියෝජනය කෙරෙන කුඩා කොටස කි. නිදසුන් ලෙස අද අප රට තුළ සිටින කෝටි දෙකකට ආසන්න මුළු ජනගහනය ම මෙබඳු සමීක්ෂණයකට යොදා ගැනීම දුෂ්කර ය. එසේනම්, කළ යුත්තේ සමස්ත ජනගහනය නියෝජනය කෙරෙන පරිදි විවිධ පළාත්වලින් සමාන ජන කොටස් කිහිපයක් තෝරාගෙන සමීක්ෂණයට භාජනය කිරීම යි. පර්යේෂණයට භාජනය වන මෙකී ජනකොට්ඨාසය එහි නියැදිය ලෙස සැලකේ.

පර්යේෂණයක් සඳහා නියැදි තෝරාගැනීම ද ඉතා කල්පනාකාරී ව කළයුත්ත කි. එනම්, එකිනෙකට වෙනස් වූ විවිධ නියැදි ක්‍රම රාශියක් ඇති බැවිනි.

i. සරල අහඹු නියැදිය හෙවත් අනියම් නියැදිය (Simple Random Sample)

ii. ස්ථරායන අහඹු නියැදිය (Stratified Random Sample)

iii. සලාක නියැදිය (Quota Sample)

iv. පොකුරු නියැදිය (Cluster Sample)

v. මණ්ඩල නියැදිය (Panel Sample)

ආදී නියැදි ක්‍රම නිරන්තරයෙන් භාවිත කෙරේ. මේ කුමක් භාවිත කළත් එයින් අදහස් කෙරෙන්නේ සමස්ත ශ්‍රාවක පිරිස අයත් වන සේ පොදු පර්යේෂණ නියැදියක් සකස් කිරීම කි.

i. සම්මුඛ සාකච්ඡා (Interviews)

ii. සමූහ සාකච්ඡා (Group Discussions)

iii. ප්‍රාදේශීය සම්මන්ත්‍රණ (Regional Seminars)

iv. අන්තර් විශ්ලේෂණයන් (Content Analysis)

v. ලේඛන විමසුම් (References) (Brown and Shannon 1996: 17,18)

ආදිය ද යම් යම් අවස්ථාවලදී අඩු වැඩි වශයෙන් පර්යේෂණ ක්‍රමෝපායයන් ලෙස යොදා ගැනේ. විශේෂයෙන් ම මෙබඳු ක්‍රමවේදයන් භාවිත කෙරෙන්නේ ප්‍රධාන පෙළේ පර්යේෂණ කාර්යයන් කෙරෙහි ලා ආධාරක කාර්යයන් වශයෙනි.

මේ කෙබඳු පර්යේෂණ ක්‍රමවේදයක් අනුගමනය කළ ද මෙයින් කෙරෙනුයේ ගුවන්විදුලි ශ්‍රාවක කොට්ඨාසයක් අධ්‍යයනය කිරීම යි.

මෙහිදී අප සලකා බැලිය යුතු තවත් කාරණා කිහිපයක් ඇත. ශ්‍රවණ පර්යේෂණ ක්‍රියාවලියෙහි දී පර්යේෂකයා අනුගමනය කළ යුතු මූලික රීතීන් මොනවා ද? සමාජ විද්‍යාත්මක පර්යේෂණයන්ට පොදු වූ මෙකී රීතීන් ගුවන්විදුලි ශ්‍රවණ පර්යේෂණයකට වුව එකසේ වැදගත් යැයි කිව හැකි ය. විශේෂයෙන් නියැදියක් තුළ කෙරෙන ක්ෂේත්‍ර සමීක්ෂණයක් හෝ ක්ෂේත්‍ර අධ්‍යයනයක් කෙරෙහි ලා මෙම රීතීන් බොහෝ දුරට ප්‍රයෝජනවත් වෙයි. ඒවා මෙසේ ය.

i. ශ්‍රාවකයා වෙත ඉදිරිපත් කරන ප්‍රශ්න මාලාව වඩාත් කෙටි වූ අසංකීර්ණ එකක් විය යුතු ය.

ii. ඒ සඳහා භාවිත කරන භාෂාව සාමාන්‍ය පොදු ජනයාට වහා තේරුම් යන සුළු, සරල වාග් රටාවකින් සමන්විත විය යුතු ය.

iii. තොරතුරු හා දත්ත ලබාගැනීමේදී පර්යේෂකයා මධ්‍යස්ථ විය යුතු ය.

iv. ප්‍රතිචාරක තොරතුරු ගවේෂණයේදී හා ඒවා එක් රැස් කිරීමේදී එම කරුණුවලට පර්යේෂකයාගේ බලපෑමක් සිදු නොවිය යුතු ය.

v. වඩාත් නිවැරදි වූත්, සත්‍ය වූත් තොරතුරු අසා දැනගැනීමට නම් පර්යේෂකයා හැමවිට ම ප්‍රතිචාරකයාට සමීප විය යුතු යි. සුහද සම්බන්ධතා මගින් අන්‍යෝන්‍ය විශ්වාසනීයත්වයක් ගොඩනඟා ගත යුතු යි. ස්වකීය නිලධාරිත්වය හෝ සෙසු සමාජ තරාතිරම අමතක කොට ඔවුන්ගේ ම සැබෑ මිතුරකු බවට පත්විය යුතු යි.

vi. ප්‍රතිචාරකයින් ලබාදෙන අදහස් සටහන් කර ගැනීමේදී වෙනස් අරුත් නොසැපයෙන ලෙස ඒ කාරිය කළ යුතු යි. බොහෝ පර්යේෂකයින් මතක තබාගැනීම මගින් තොරතුරු එක්රැස් කිරීමේදී අවසාන දත්ත විග්‍රහය වඩාත් දුෂ්කර කාරියක් බවට පත්වෙයි. පටිගත කිරීමේ යන්ත්‍රයක් (කැසට් රෙකෝඩරයක්) භාවිත කිරීමෙන් එම දුෂ්කරතාව පහසුවෙන් මඟහරවා ගත හැකි ය.

vii. පර්යේෂකයාගේ පුද්ගලික දෘෂ්ටීන් හා විශ්වාසයන් පර්යේෂණ නිගමනවලට බාධාවක් හෝ බලපෑමක් නොවිය යුතු යි. බොහෝ පර්යේෂකයින් අවසන් නිගමනවලට පදනම් කොට ගන්නේ පර්යේෂණයට පෙර සිට ම තමන් තුළ තිබූ පුද්ගලික විශ්වාසය හා දෘෂ්ටිය යි. පර්යේෂණයට පෙර ඔහු යෝජිත විසඳුමක හෝ මූලික උපන්‍යාසයක පිහිටීම වරදක් නොවේ. නමුත්, එකී තත්වය ම හැමවිට ම අවසාන නිගමනය වන්නේ නැත. එබැවින්, නිගමනය සම්බන්ධයෙන් ඔහු තුළ පැවතිය යුතු මධ්‍යස්ථභාවය මෙහි අත්‍යවශ්‍ය රීතියක් වෙයි. ඒ මන්දයත්, විද්‍යානුකූල පර්යේෂණයක හරය වූ කලී තර්කානුකූල විසඳුමක් ම විය යුතු බැවිනි.

මෙබඳු රීතීන් යටතේ සිදු කෙරෙන ශ්‍රවණ පර්යේෂණයක් නම් එය වඩාත් විද්‍යානුකූල වේ යැයි සිතිය හැකි ය. ඒ මන්දයත්, ඔවුන්ගේ සිතැඟි ඔවුන්ගේ වචනයෙන් ම ලබාගෙන වඩාත් නිවැරදි නිගමනවලට එළඹිය හැකිවීම යි.

## නිගමනය

ග්‍රාහකයා වඩාත් කැමති, ඔවුන්ට වඩාත් ප්‍රයෝජනවත් වැඩසටහන් සැලසුම් කිරීමට මේ මගින් අවස්ථාව සැලසේ. දුර්වල වැඩසටහන් ඉවත් කිරීම හෝ එකී දුබලතා මඟහරවා ගැනීමෙහි ලා කටයුතු කිරීම ද ශ්‍රවණ පර්යේෂණයකින් අනතුරුව සිදු කළ හැකි කාර්යය කි. එමෙන් ම විවිධ ප්‍රදේශවල ශ්‍රවණ තත්ත්වයන් හඳුනාගැනීම, ගුවන්විදුලිය සන්නිවේදන කාර්යයට අදාළ විවිධ විෂයයික සංඛ්‍යාත්මක ඇගයුම් ලබාගැනීම ද මේ මගින් සිදු වේ. මෙහිදී වඩාත් වැදගත් ලෙස කැපී පෙනෙනුයේ ශ්‍රාවක රුචිකත්වය සහ රසවින්දන තත්ත්වයන් ඉහළ තලයකට නැඟවාගෙන ඒමත්, ප්‍රගතිගාමී අනාගත අපේක්ෂාවන් ඉටුකරගත හැකි වන පරිදි නව ආකල්පමය හා චර්යාමය රටාවක් කෙරෙහි අනුබල සැපයෙන මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීමට අදාළ පසුබිම සැකසීමත් වෙයි. හුදෙක් සරල ප්‍රශ්නාවලියකට ලබාගන්නා පිළිතුරුවලට ඔබ්බෙන්, ඊටත් ගැඹුරින් විමසා බැලිය යුතු සමාජ, ආර්ථික දේශපාලනික හා සංස්කෘතිකමය අන්තර්ගතයක් ඒ තුළ සැඟව ඇති බව එයින් අවධාරණය කෙරේ. ඒ අනුව සමස්තයක් වශයෙන් ගත් කල ගුවන්විදුලිය මාධ්‍යයේ ප්‍රවර්ධනය මෙන් ම සමාජ ඉදිරිගමන කෙරෙහි ඉත් කළ හැකි ඉෂ්ට බලපෑම ද තහවුරු කරගැනීමට මෙබඳු ශ්‍රවණ පර්යේෂණයන් මහෝපකාරී වනු ඇත.

## පරිශීලිත මූලාශ්‍රය


කරුණානායක, නන්දන (1989) *ශ්‍රී ලංකා ගුවන්විදුලිය: වැදගත් සිදුවීම් 1921-1989,* මොරටුව, ජනමාධ්‍ය සහ ජාතික ප්‍රතිපත්ති පර්යේෂණ කේන්ද්‍රය.

කොළඹගේ, ඩී.එම්. (1980) *ගුවන්විදුලි වංශය*, කොළඹ, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව.

මහේන්ද්‍ර, සුනන්ද (1997) *සන්නිවේදන ශබ්දාකරය*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Brown, W. and Shannon, G. (1996) *Audience Research in to Radio: Key Areas of Sociological Methods*, New Jercey, Will Brown Press.

Dassguptha K. K. (1992) *Media Research and Social Effects : A Handbook for Sociological Audience Research*, New Delhi, Puma Book Publishers.

Finn, F. De and Bill, W. (1981) *Contemporary Approaches for Sociological Research*, New Delhi, Prentice Hall, Englewood Clifts.

Gamble, Michael. W. and Gamble, Terikwal (1986) *Introducing Mass Communication: Communication, Mass Media and You (chaptre.1)* New York, Mc Graw Hill Book Co.

Karunanayake, Nandana (1990) *Radio Broadcasting in Sri Lanka; Significant Dates and Events 1921-1990*, Moratuwa, CMPS.

Moshov, K (1991) *Communication Research in Asia Pacific Region*, The Report Issued by the Center for Research and Policy planning, India.

Pallow, James. D (According to the research report on "Effects of Electronic Media and Social Changes" Conducted by the UNESCO)

Watson, James and Hill, Anne (1991) *A Dictionary of Communication and Media Studies* (2nd edition), England, Edward Arnold Limited.